ස/ අධි/6/2/10/පෝෂණ

2012.08.09

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

සහකාර සමෘද්ධි කොමසාරිස් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ ,

ප්‍රාදේශීය ලේකම් / ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,

සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරීන්,

සමෘද්ධි කළමනාකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**විශේෂ පෝෂණ වැඩසටහන සඳහා ඉලක්ක ගත කණ්ඩායම් පිළිබඳව තොරතුරු ලබාගැනීම.**

ඉහල පෝෂණ තත්ත්වයෙන් පිරිපුන් ජනතාවක් ශ්‍රී ලංකාව තුල බිහි කිරීමේ අරමුණින් විශේෂ පෝෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් උපදෙස් ලබාදී ඇත. ඒ අනුව සමාජයේ විශේෂ අවධානයක් හිමිවිය යුතු ඉලක්ක ගත කණ්ඩායම් පිළිබඳව නිවැරදි සංඛ්‍යාත්මක දත්ත මූලිකව ලබාගත යුතුව ඇත.

02. සියලුම ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි මෙම තොරතුරු රැස්කර ගැනීමේ භාරදූර වගකීම ක්ෂේත්‍රයේ කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත පැවරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තීරණය කර ඇත. ඒ අනුව පහත සඳහන් එක් එක් කාණ්ඩයන් යටතේ සමෘද්ධිලාභීන් , අඩු ආදායම්ලාභීන් හා අනෙකුත් පවුල් වල සිටින සංඛ්‍යාව නිවැරදිව ලබාගත යුතුව ඇත.

- ගර්භණී මව්වරුන්
- කිරිදෙන මව්වරුන්
- වයස අවු 3 ට අඩු දරුවන්

03. මෙම වාර්තාව වසම් මට්ටමින් සකස් කල යුතු අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දිස්ත්‍රික් සාරාංශ වාර්තාව මේ සමග ලබාදී ඇති ආකෘතියට අනුව 2012.08.20 දිනට පෙර ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ජීවනෝපාය සංවර්ධන අංශය වෙත ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

(ෆැක්ස් අංක - 011-2872201 / 011-2889009)

මෙම කර්තව්‍ය සාර්ථක කර ගැනීමට ඔබ දක්වන දායකත්වය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :- 1. ගරු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා - කා.දැ.ගැ.පි.
2. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - - එම -
3. අතිරේක ලේකම් (සංවර්ධන) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - - - එම -